ශීර්ෂය - 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන්

සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්,එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2025 පෙබරවාරි 18 දිනැති සංශෝධිත රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුව මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ වාර්තා කිරීමේ පදනම සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ආකෘතිමය සංශෝධනයන් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළව විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය සංශෝධනයන් සිදුකර නොතිබුණි.	මෙම වසරේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවරදි කර ගැනීමට කටයුතු කරන බවට දන්වා සිටිමි.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 06 ඡේදයට අනුව ඒසීඒ 2 (iii) ආකෘතිය පිළියෙල කිරීමේදී මූලික වියදම සහ සංශෝධිත වියදම අතර වෙනස පැහැදිලි කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබූ ඒසීඒ 2 (iii) ආකෘතියෙහි සංශෝධිත වියදම් ඇස්තමේන්තුව ලෙස සත්‍ය වියදම සඳහන් කර තිබුණි.	නිවැරදි ලෙස සකස් කරන ලද ඒසීඒ 2 (iii) ආකෘතිපත නිසි කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ රු.4,000,000 ක් වූ ඉන්ධන ඇස්තමේන්තුගත වියදම ප්‍රමාණනවත් නොවීම නිසා ප්‍රතිපූරණය කිරීමකින් තොරව නාවික හමුදාවෙන් ඉන්ධන ලබාගෙන තිබුණි. මේ අනුව	ඉන්ධන සඳහා වෙන් කරන ලද රු. 4,000,000 ක ප්‍රතිපාදන අතුරින් රු. 3,811,696 ප්‍රතිපාදන වියදම් කර ඇති අතර, එය දෙපාර්තමේන්තුවේ වාහන සඳහා අවශ්‍ය ලිහිසි තෙල් මිලදී ගැනීමට දරා ඇත. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු වාහන, නෞකා	දෙපාර්තමේන්තුවට අදාල නිවැරදි ඉන්ධන වියදම මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කළ යුතුය.

දෙපාර්තමේන්තුව විසින් භාවිතා කළ නෞකා ,යාත්‍රා ඇතුළු වාහන වෙනුවෙන් වෙනත් , අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු විසින් වැයකළ ඉන්ධන පිරිවැය රු.373,986,555 ක් වූ නමුත් ඒසීඒ-2 ආකෘතීන්වල 1202 වැය විෂයය යටතේ ඉන්ධන වියදම රු. 3,811,696 ක් පමණක් සටහන් කර තිබුණි. ඒ අනුව රු.377,798,251 ක් වූ නිවැරදි ඉන්ධන වියදම මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර නොතිබුණි.	සහ යාත්‍රා සඳහා අවශ්‍ය ඉන්ධන ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව දරා ඇත. ඉදිරි වර්ෂයන්ට අදාලව ඉන්ධන වෙනුවෙන් දරණු ලබන වියදම්, මූල්‍ය ප්‍රකාශන තුල පෙන්වාදීමට මුදල් අමාත්‍යාංශය දැනුවත් කර අවශ්‍ය අනුමැතිය ලබාගැනීමටත්, ඒ අනුව අනුගමනය කල යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවශ්‍ය නිසි උපදෙස් කඩිනමින් ලබා දෙන මෙන් අයැද ආරක්‍ෂක අමාත්‍යාංශය වෙත යොමුකළ ලිපියට පිළිතුරු ලෙස 2025 වර්ෂයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ප්‍රතිපාදන වෙන් කිරීමේදී ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව වෙත ඉන්ධන සහ ලිහිසි තෙල් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වටිනාකම වෙන් වෙන් වශයෙන් වෙන් කිරීමට කටයුතු කරන බවත්, මූල්‍ය ප්‍රකාශන තුල නිසි පරිදි නිරූපණය කිරීමේ හැකියාවක් පවතින බවත් දන්වා ඇත.

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 ජනවාරි 19 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2024 හා 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 8.2 ඡේදය ප්‍රකාරව, වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් තිබේනම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු අගයට ගිණුම් ගත කළ යුතුය. එසේ වුවද, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට විදේශ ප්‍රදාන වශයෙන් හිමිව තිබූ වටිනාකම රු.45,391,232 ක් පමණ වූ මූල්‍ය නොවන වත්කම් , ඒසීඒ - 6 ආකෘතියෙහි ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය	2024 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද විෂයන් ගිණුම්ගත කිරිම සඳහා ඉදිරිපත් කර ඇති අතර, එම විෂයන් ගිණුම් ගත කිරිම සඳහා අදාල කටයුතු සිදු කරමින් පවති. තවද 2025 අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි එම විෂයන් ඇතුලත් කිරිමට කටයුතු සිදු කරන බවට වැඩිදුරටත් දැන්වේ.	මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය කාල පරිච්ජේදයේ අවසාන දිනට පවතින සියළුම මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය.

	නොවන වත්කම් රු.38,996,346 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් කර තිබුණි.		
(ii)	සමාලෝචිත වර්ෂයේ ඒසීඒ - 06 ආකෘතියට අනුව මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය රු.2,591,869,939 ක් වුවද, 2023 වර්ෂයේ ඒසීඒ- 06 ආකෘතියට අනුව මූල්‍ය නොවන වත්කම් අවසාන ශේෂය රු.2,547,673,953 ක් විය. ඒ අනුව, රු.44,195,986 ක වෙනසක් නිරීක්ෂණය විය. 2023 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ප්‍රවාහන උපකරණ (කාණ්ඩ අංක 2.1) වර්ගීකරණය තුළ වෙන් වශයෙන් ඇතුළත් නොවූ පිරිවැය රු.26,773,159 ක් වූ වාහන 2024 වර්ෂයේ ආරම්භක ශේෂයන්හි ඇතුළත් කර තිබීම හා යන්ත්‍ර හා උපකරණ (2.2 කාණ්ඩය) වර්ගීකරණය තුළ අයිතම 07 ක ආරම්භක ශේෂයන් රු.17,422,828 කින් සංශෝධනය කර තිබීම ඉහත වෙනසට හේතු වී පැවති නමුත් මෙම සංශෝධනයන් පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි.	මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය අතර වෙනසට හේතු වී ඇත්තේ විදේශ ප්‍රධානයන් වශයෙන් 2024 වර්ෂයේදී ලද විෂයන් ගිණුම් ගත කිරීම සඳහා CIGAS පද්ධතියට ඇතුලත් කිරීමේදී එම අගයන් අතපසුවීමකින් අරම්භක ශේෂයට එකතු වී ඇති බවට කරුණු දැක්විය හැකි අතර, එය නිවැරදි කිරීමට කටයුතු සිදු කරමින් පවතී.	රු.2,547,673,953 ක් වූ වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි වටිනාකම අනාවරණය කළ යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් (ඒසීඒ- 06) උපලේඛනය අනුව, 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු නෞකා, යාත්‍රා හා බෝට්ටු වටිනාකම රු.133,576,670 ක් වුවද, 2025 අප්‍රේල් 09 දිනැති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක ඩීජීසීජී/එල්ඕජී/10(ආ) දරණ ලිපිය ප්‍රකාරව එදිනට දෙපාර්තමේන්තුව සතු නෞකා, යාත්‍රා හා බෝට්ටු 30 ක වටිනාකම රු. 3,429,633,315 ක් විය. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් හා දේපල, පිරියත හා උපකරණ සංචිතය රු.3,296,056,645 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා තිබුණි.	දෙපාර්තමේන්තුව සතුව පවතින නෞකා හා යාත්‍රා, නාවික හමුදාව සහ විදේශ රටවල් කිහිපයක් මගින් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත. මෙම යාත්‍රාවන්ගෙන් CG 61(ජයසාගර) හා CG 106(RHIB) යාත්‍රාවන් පමණක් (ඒසීඒ-06) උපලේඛනයට ඇතුලත්වී ඇති අතර අනෙකුත් යාත්‍රා වල වටිනාකම් ඇතුලත්වී නොමැත. ඒ බැවින් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතුව දැනට පවතින යාත්‍රා සහ නෞකා 31 ක ලේඛණයට අදාලව ඉහත සඳහන් යාත්‍රා දෙක නොමැතිව ඉතිරිව ඇති යාත්‍රා 29ක වටිනාකම කඩිනමින් මෙම උපලේඛණයට ඇතුලත්කිරීමට කටයුතු කරන බව කරුණිකව දන්වා සිටිමි.	නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන තුල වාර්තා කිරීමට කටයුතු කල යුතුය.

(iv)	2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු ශ්‍රී ලංවෙආනෞ සුරක්ෂා (CG 60) නෞකාව පිරිවැය හෝ තක්සේරු වටිනාකමට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතුව පවතින CG 60(සුරක්‍ෂා) නෞකාව 2017.7.14 දින දෙපාර්තමේන්තුවට පරිත්‍යාගයක් ලෙස ලබාදී ඇත. තවද මෙම නෞකාව සඳහා නිසි තක්සේරු වටිනාකමක් මේ දක්වා සඳහන් කර නොමැත.	නිසි පරිදි තක්සේරුකර මූල්‍ය ප්‍රකාශන තුළ වටිනාකම වාර්තා කල යුතුය.
(v)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් (ඒසීඒ- 06) උපලේඛනය අනුව, 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු වාහන වටිනාකම රු.89,258,076 ක් වුවද, 2025 අප්‍රේල් 10 දිනැති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීජීසීජී/එල්ඕජී/10(ආ) දරණ ලිපිය ප්‍රකාරව, එදිනට දෙපාර්තමේන්තුවේ නමින් ලියාපදිංචි වී ඇති වාහන 75 කට අදාළ වටිනාකම රු.81,788,958 ක් විය.දෙපාර්තමේන්තුව සතු රු.21,486,533 ක වටිනාකමින් යුත් ATV යන්ත්‍ර 03ක් පවතින බවත් ඒ අනුව එම වාහන 75 හි හා ATV යන්ත්‍ර 03 හි සමස්ථ වටිනාකම රු.103,275,491 පමණ විය යුතු බවත් නිරීක්ෂණය වූ බැවින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් හා දේපළ,පිරියත හා උපකරණ සංචිතය රු.14,017,415 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි.	දෙපාර්තමේන්තුව සතු ATV (All-Terrain Vehicle) රථ 03 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල නොහැකි නමුත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ (NFAMS පද්ධතියේ) වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව සතු දේපලක් ලෙස අදාල රථ වාහන ඇතුලත් කර ඇති අතර ඒවායෙහි වටිනාකම රු 21,486,533 වේ. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් (ඒසීඒ - 06) දෙපාර්තමේන්තුව සතු ඉතිරි රථ වාහන 53 ක වටිනාකමක් එක්විය යුතු අතර රථ වාහන කාණ්ඩයට ඇතුලත් නොවන අමතර කොටස්, බැටරි සහ පා පැදිය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් (ඒසීඒ - 06) උපලේඛනයෙන් ඉවත්විය යුතු බවට දන්වන අතර මෙම වටිනාකම්හි පරස්පර තාවය විසඳීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.	මූල්‍ය නොවන වත්කම් හා දේපළ,පිරියත උපකරණ වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුළට අන්තර්ගත කළ යුතුය.

2. **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශුද්ධ ප්‍රතිපාදනය රු.10,000,000 ක්වූ 2401-17 වැය විෂයය යටතේ කාර්යය මණ්ඩල පුහුණු (JICA) සඳහා වෙන්කරනලද ප්‍රතිපාදන සියල්ල වර්ෂය අවසාන දිනට ඉතිරිවී තිබුණි.	2101-17 වැය ශීර්ෂය යටතේ කාර්යය මණ්ඩල පුහුණු (JICA) සඳහා වෙන් කරන ලද රු. 10,000,000 ක ප්‍රතිපාදන නාමිකව පමණක් (ගිණුම් ගත කිරීම පිණිස) මෙම දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන තිබුණු හෙයින් මේ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී කරුණු දැක්වීමෙන් අනතුරුව මෙම ප්‍රතිපාදන සම්බන්ධයෙන් වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු සිදු නොකරන බවට තීරණය කරන ලදී.	ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කිරීමට අදාල ආයතන සමග එක්ව කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය හා මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ එම ආයතනයට පැවරෙන නිශ්චිත ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් , ක්‍රියාත්මක කාල රාමුව , අපේක්ෂිත ප්‍රතිදානය හා ප්‍රතිඵලයද ඒ සඳහා වගකිව යුතු පාර්ශවයද ඇතුළත්කළ යුතු නමුත්, පිළියෙලකර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් අංශයට පැවරී ඇති සියලු වගකීම් ක්ෂේත්‍ර හා ඒ යටතේ වන ක්‍රියාකාරකම් නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණු අතර වාර්ෂික ප්‍රතිපාදන වැයකරනු ලබන ආකාරය සහ අපේක්ෂිත මූල්‍ය හා භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය පමණක් දක්වා තිබුණි.	2024 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්මේ පැවති අඩුපාඩු සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලද අතර, ඒ අනුව 2025 අප්‍රේල් මස 08 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ 2025 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවේදී ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති සියළුම දෙපාර්තමේන්තු වලට අදාල අඩුපාඩු දිර්ඝ ලෙස සාකච්ඡා කර එම අඩුපාඩු 2025 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මෙහි නිවැරදි විය යුතු ආකාරය සම්බන්ධයෙන් දැනුවත් කරන ලදී. ඒ අනුව, 2025 අප්‍රේල් මස 10 වන දින ඉහත සාකච්ඡාවේදි පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කර 2025 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව සඳහා පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.	අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්, ක්‍රියාත්මක කාල රාමුව ,අපේක්ෂිත ප්‍රතිපාදනය හා ප්‍රතිඵලයද ඒ සඳහා වගකිව යුතු පාර්ශවයද ඇතුළත්ව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතුය.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ වෙනත් යම් නිශ්චිතව සඳහන් ආයතන සහ කොමිෂන් සභා සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් සෑම විගණනය කරනු ලබන ආස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ , රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තාද සමග ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් , 2025 අප්‍රේල් වන විටත් සමාලෝචිත වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පත විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාව සිංහල භාෂාවෙන් පිළියෙල කර 2025 මාර්තු මස 27 දින ආරක්‍ෂක අමාත්‍යාංශයේ නිරීක්‍ෂණ කටයුතු සඳහා මේ වන විට ඉදිරිපත් කර ඇත. ආරක්‍ෂක අමාත්‍යාංශයේ නිරීක්‍ෂණයන් ලැබීමෙන් පසු ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් පරිවර්තනය කර නැවත වාර්තාව ආරක්‍ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි. ආරක්‍ෂක අමාත්‍යාංශයේ නිරීක්‍ෂණයන් ලද පසු විගණනය කරන ලද අවසන් ගිණුම් වාර්තා සහ විගණන වාර්තාව ද ඇතුලත් කර අවසන් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවට වැඩිදුරටත් දැන්වේ.	මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතද ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.
(ආ)	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගන්නා වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන සතු ඉඩම් කැබලි 06 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවරාගැනීමට අපොහොසත්ව තිබූ බව නිරීක්ෂණය විය.	වැල්ලවත්ත (වරුණ ආයතනය පිහිටි ඉඩම) , බලපිටිය ජීවිතාරක්‍ෂක පුහුණු පාසල, පානදුර හා තොඩුවාව පිහිටි ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. තවද, දික්ඕවිට (වරාය) නාවික හමුදාවට අයත් භූමිය හා කොඩ්බේ ඉඩම පවරා ගැනීමට එකඟතාවයක් ලැබී නැත.	පවරාදීමට එකඟතාවන් ලැබී ඇති ඉඩම් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකර කඩිනමින් පවරාගැනීම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේදී අත්අඩංගුවට ගෙන තිබූ මත්ද්‍රව්‍ය අතරින් KENNDU LEAVES නමැති මත්ද්‍රව්‍ය කි.ග්‍රෑ.15,067ක් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවටද අනෙකුත් මත්ද්‍රව්‍ය සියල්ලම ශ්‍රී ලංකා පොලීසියටද භාරදී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරම් සිදුකර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය නිතිමය කටයුතු සඳහා CG 003 පෝරමය මගින් ලිඛිතව ශ්‍රී ලංකා රේගුවට හා ශ්‍රී ලංකා පොලිසිය වෙත භාරදීමෙන් අනතුරුව එහි පිටපත් ආරක්ෂක අමාත්‍යාංශය වෙත සහ ජාතික විගණන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන අතර එම ඉදිරි නිතිමය කටයුතු එම ආයතනය මඟින් සිදු කරනු ලබන අතර පසුවිපරම් කිරීමේ කටයුතු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු නොලැබේ.	අත්අඩංගුවට ගනු ලබන මත්ද්‍රව්‍ය අදාල ආයතන වෙත භාරදීමෙන් පසු නීතිමය කටයුතුවල ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කළ යුතුය.

4.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රු. මිලියන 98 ක ඇස්තමේන්තුගත වියදමක් යටතේ වෙරළ ආරක්ෂක වරුණ ආයතනය සඳහා නේවාසික, පරිපාලන පහසුකම් සහිත සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබූ නමුත් එම ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කළ දිනය විගණනයට අනාවරණය කිරීමට අපොහොසත් වූ අතරම 2022 හා 2023 වර්ෂයෙහිදී මේ සඳහා පිළිවෙලින් රු.10,000,000 ක් හා රු.35,000,000 ක් බැගින් එකතුව රු.45,000,000 ක් වෙන් කර තිබුණද එකී වර්ෂවල පිළිවෙලින් රු.4,911,478 ක් හා රු.13,710,142 ක් වශයෙන් එකතුව රු.18,621,620 ක් වියදමක් දරා තිබුණි. එසේ වුවද මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ශූන්‍ය ප්‍රතිශතයක් විය.	ශ්‍රීලංවෙආ වරුණ ආයතනයේ සිව් මහල් ගොඩනැගිල්ල සඳහා 2022 හා 2023 වර්ෂයන් තුළදී මුදල් ප්‍රතිපාදන ලැබී තිබුණි. තවද ඒ වනවිට මෙම භූමියේ අයිතිය ශ්‍රීලංවෙආදෙ සතුව තිබූ අතර එම නිසා ඒ සඳහා රු. 18,621,620 ක භාණ්ඩ ඇණවුම් කර තිබූ අතර ඉන්පසු භූමියේ අයිතිය පිළබඳ ගැටළුකාරී තත්වයක් උද්ගත වූ බැවින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වූ අතර ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ශූන්‍ය විය.	භූමියේ අයිතිය නිරවුල් නොවී ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ කිරීම හා මිලදී ගැනීම්ද නොකළ යුතු අතර මිලදීගත් භාණ්ඩ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු නෞකා හා යාත්‍රා අතරින් මාස 06 කට වඩා ක්‍රියාවිරහිතව පැවති යාත්‍රා 05 ක් තිබුණි. එකී යාත්‍රා මිළදී ගැනීමෙන් පසු ක්‍රියාවිරහිත තත්ත්වයට පත්වන විට භාවිතය ආරම්භකර වසර 04 සිට 32 දක්වා පරාසයක පැවති අතර එකී සියළුම යාත්‍රා අළුත්වැඩියා කටයුතු සඳහා භාරදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට අළුත්වැඩියාව සඳහා භාරදී වසර 1½ සිට වසර 03 ක් දක්වා කාළයක් ගත වී තිබුණද අළුත්වැඩියාව අවසන්ව නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දින වන විට වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු නෞකා හා යාත්‍රා 05 හි විස්තර සියල්ල නිවැරදි වන අතර මේ වන විට එම යාත්‍රා 05 න් (**CG** 103, **CG** 203, **CG** 204, **CG** 403 සහ **CG** 405) යාත්‍රා 02 ක් (**CG** 203 සහ **CG** 204) අළුත්වැඩියාවෙන් පසු ක්‍රියාකාරී තත්වයට පත්කර ඇති අතර ඉන් **CG** 403 යාත්‍රාව අලුත්වැඩියා කටයුතු සඳහා අධික මුදලක් වැයවන බැවින් එය සුදුස්සක් කිරීමට නියමකර ඇත.	ක්‍රියා විරහිතව පවතින යාත්‍රා දෙක කඩිනමින් අළුත්වැඩියා කර ගැනීමට කටයුතු කල යුතු අතර සුදුස්සක් කිරීමට යෝජිත යාත්‍රාව සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු **CG** 408 නාවික යාත්‍රාව වසර 03 කුත් මාස 04 ක කාලසීමාවක්	දෙපාර්තමේන්තුව සතු සීජී 408 යාත්‍රාව අලුත්වැඩියාව සඳහා අධික මුදලක් වැයවන බැවින් එය සුදුසුසක් කර ටෙන්ඩර් මණ්ඩලයක් හරහා විකිණීම සඳහා 2025 මාර්තු 14 දින මිල	**CG** 408 යාත්‍රාව ඉවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත

	ගර්හිත තත්ත්වයේ පැවතුණි.	කැඳවුම්පත් විවෘත කලද ඒ සඳහා සැපයුම් කරුවන් මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් නැවත මිල කැඳවීම් සඳහා කටයුතු සිදු කර ඇත. ඒ අනුව **CG** 408 දරණ යාත්‍රාව වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව මගින් ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දින වන විට WP KG 5476 දරන 2008 වර්ෂයේ ලියාපදිංචි කල කැබ් රථය හා WP PF 5410 දරන 2014 වර්ෂයේ ලියාපදිංචි කල කැබ්රථය ධාවනයට සුදුසු මට්ටමේ නොපවතින නමුත් අයිතිය පවරාගැනීම හා අළුත්වැඩියා කිරීම සමාලෝචිත වර්ෂය තුල සිදුව නොතිබුණි.	WP KG 5476 සහ WP PF 5410 අංක දරණ රථ ආරක්‍ෂක අමාත්‍යාංශය මගින් වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවට 2024 දෙසැම්බර් 24 දින ලබා දුන් අතර එම රථ දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට අවශ්‍ය ලිපි ලේඛන සමග අවශ්‍ය අනුමැතිය 2025 ජනවාරි 23 වන දිනැති අංක එම්ඕඩී/ඒඩීඑම්/ටිආර්ඒ/01/02/12 දරණ ආරක්‍ෂක අමාත්‍යාංශ ලේකම් ගේ ලිපිය මගින් ලබා දී ඇත. එම රථ දීර්ඝ කාලයක් ධාවනයට නුසුදුසු තත්වයේ තිබූ බැවින් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු අදාල රථ දෙක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් නමින් ලියාපදිංචි කිරීමෙන් අනතුරුව සිදු කිරීමට කටයුතු යොදා ඇත.	විධිමත් පරිදි අයිතිය පවරා ගැනීමට හා කඩිනමින් අළුත්වැඩියා කිරීමට කටයුතු කල යුතුය.

4.5 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) හා (ඇ) වගන්ති ප්‍රකාරව, අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු අතර ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කරනු ලැබිය යුතු වුවත් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2024 ඔක්තෝබර් 31 දක්වා පමණක් පිළියෙල කර තිබුණු අතර 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය හා	ප්‍රසම්පාදන සැලැස්ම 2024 ඔක්තෝබර් 31 දින දක්වා පමණක් පිළියෙල කර ඇත්තේ මිළදී ගැනීම් ලිපිගොනු ආරම්භ කර ප්‍රසම්පාදන කටයුතු සිදු කරගෙන යාමේ ක්‍රියාවලියේදී ඇතිවන විවිධ ගැටළු මගහරවා ගැනීමට පමණක් නොව දෙසැම්බර් 15 දින වන විට නිරවුල් නොවූ සියළුම බිල්පත් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත්ව සිදු කිරීමේ අරමුණින් සහ මිළදීගැනීම් සඳහා ආරම්භ කරන ලිපිගොනු නොවැම්බර් හෝ දෙසැම්බර් ආරම්භ කලහොත් බිල්පත් කෙටි කාලයක් තුල නිරවුල් කිරීමේදී විය හැකි ප්‍රායෝගික ගැටළු නිරාකරණය කර ගැනීමට වේ. ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ඇතුලත් කාල ක්‍රමානුගතව	ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී මාර්ගෝපදේශයන්ට අනුගතව පිළියෙල කළ යුතුය.

	මාර්ගෝපදේශ අංක 13 ප්‍රකාරව සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2. (අ) හා (ආ) වගන්ති ප්‍රකාරව, ප්‍රසම්පාදනය ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් පිලියෙල කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.	විස්තර කරන ලේඛණයට අනුව සියළුම ප්‍රසම්පාදන කටයුතු 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා සිදු කර ඇති බවත් 2024 මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව 2025 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ඇතුලත් කාල ක්‍රමානුගතව විස්තර කරන ලේඛණයට අනුව 2025 ජනවාරි 01 සිට සියළුම ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලැබේ.	
(ආ)	2021 – 2024 කාල පරිච්ඡේදයේ සිදුකරන ලද සමස්ථ වටිනාකම රු. 12,893,403 ක් වූ ප්‍රසම්පාදන 19 කට අදාලව සැපයුම්කරුවන්ට ඇණවුම් නිකුත් කර තිබූ නමුත් ප්‍රමාණවත් තොග නොමැති වීම හා වෙළඳපොළ මිළ ගණන් ඉහළයාම මත අදාළ සැපයුම්කරුවන් විසින් සැපයුම් සිදු කිරීම පැහැර හැර තිබූ බව නිරීක්ෂණය විය. එසේම මේ සම්බන්ධ ඇණවුම් සිදු කරන අවස්ථාව දක්වා වූ වියදම් පියවා ගැනීමට නොහැකි වීම මත එකී වියදම් නිෂ්කාර්යය වියදම් බවට පත්ව තිබූ බව නිරීක්ෂණය විය.	2021 සිට 2024 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු කල ප්‍රසම්පාදනයන්ට අදාල සැපයුම්කරුවන් විසින් රු. 100,000 වැඩි ප්‍රසම්පාදන කටයුතු පැහැර හැරීම සම්බන්ධයෙන් අවධානය යොමු කල අතර, දෙපාර්තමේන්තුව මඟින් ලංසු ආරක්‍ෂණ (Performance Bond) ලබා ගැනීම සිදු කරනු ලබන්නේ රු. මිලියන 05 ඉක්ම වූ ලිපිගොණු සඳහා පමණක් බවත්, මෙහි රු. මිලියන 05 ඉක්ම වූ ලිපිගොණු නොමැති බවත් පෙනී යයි. එබැවින්, ඉදිරියේදී ඇතිවන්නාවූ මෙවන් තත්ත්වයන් සඳහා ප්‍රසම්පාදන කමිටු මණ්ඩලයේ (DPC) අනුමැතියෙන් පසු අදාල සැපයුම්කරුවන් සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දැන්වේ.	සැපයුම්කරුවන් විසින් ප්‍රසම්පාදනයට අදාල සැපයුම් පැහැර හැරීම සම්බන්ධව නිසි පියවර ගත යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2009 අංක 41 දරන ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත පරිච්චින්න කර නව පනතක් සම්පාදනය කිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 16/2249/703/093 දරන 2016 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම පනත පරිච්ින්න කර නව පනතක් සම්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තු පනත පරිච්ින්න කර නව පනතක් සම්පාදනය කිරිමට අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණද, මේ වනතෙක් නව පනත පරිච්ින්න කිරීමේ කටයුතු නිම වී නොමැත. පනත සම්පාදනය කිරිමේ කටයුතු දීර්ඝ කාලයක සිට අවසන් නොවී පවතින අතර එම පනත සම්පාදනය කිරිම අතිශය අවශ්‍යතාවයක් බව 2023 සැප්තැම්බර් 15 වන දින ආරක්‍ෂක අමාත්‍යාංශය වෙත වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව විසින් කරුණු ඉදිරිපත් කර ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නව පනතක් සම්පාදනය කිරීමට කඩිනමින් කටයුතු කල යුතුය.